රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

பதிவாளர் நாயகம் திணைக்களம்

# Registrar General's Department



# කාර්ය සාධන වාර්තාව හා ගිණුම් -2014

# பெறுபேற்று அறிக்கையும் கணக்கும் -2014

# Performance Report & Accounts -2014

No.234/A3,Denzil Kobbekaduwa Mawatha,Battaramulla,Sri Lanka.
T.P. No: 011-2889488-89 Fax No: 0112889491 E-mail: info@gov.lk Website: www.rgdept.lk

# පටුන


- ස්වදේශ කටයුතු අමාත්‍යතුමාගේ පණිවිඩය 03
- ස්වදේශ කටයුතු අමාත්‍යාංශ ලේකම්තුමාගේ පණිවිඩය 04
- රෙජිස්ට්‍රාර් ජනරාල්තුමාගේ පණිවිඩය 05
- දෙපාර්තමේන්තුවේ ව්‍යුහය 07
- අපගේ දැක්ම සහ මෙහෙවර 08

**I වන පරිච්ඡේදය**

දෙපාර්තමේන්තුවේ කාර්යයන් හා ක්‍රියාකාරකම් 09

දෙපාර්තමේන්තු කාර්ය මණ්ඩලය 12

**II වන පරිච්ඡේදය - ලේඛණ ලියාපදිංචි කිරීම.**

1. නොතාරිස්වරුන් පිළිබඳ විස්තර 14
2. 2013 වර්ෂය තුළ නිකුත් කළ නොතාරිස් බලපත්‍ර සංඛ්‍යාව 14
3. ඉඩම් ලේඛන ලියාපදිංචි කිරීමේ දෝෂ නිවැරදි කිරීම 15
4. දිරාපත් ඉඩම් ලේඛන නැවත සකස් කිරීම 15
5. ලේඛන ලියාපදිංචිය 15
6. ලේඛණ සංරක්ෂණය 16
7. ඉල්ලුම් පත්‍ර ලැබීම් 17
8. දෙපාර්තමේන්තුව විසින් අයකර ගන්නා ලද ගාස්තු ප්‍රමාණයන් 19

**III වන පරිච්ඡේදය - හිමිකම් ලියාපදිංචි කිරීම**

1. හිමිකම් ලියාපදිංචි කිරීමේ වැඩසටහන ක්‍රියාත්මක කිරීමේ කාර්යාල 21
2. පුහුණු වැඩසටහන් 22
3. මූල්‍ය සහ යටිතල පහසුකම් 22
4. පසු ගනුදෙනු ලියාපදිංචි කිරීමේ ප්‍රගතිය 24
5. දෙපාර්තමේන්තුව විසින් අයකර ගන්නා ලද ගාස්තු ප්‍රමාණයන් 24

## IV වන පරිච්ඡේදය - සිවිල් ලියාපදිංචි කිරීම


1. රෙජිස්ට්‍රාර්වරු 26
2. ලියාපදිංචි කරන ලද විවාහ, උපත් සහ මරණ සංඛ්‍යාව 26
3. විදේශයන්හි පිහිටි ශ්‍රී ලංකා තානාපති කාර්යාල මගින් ලියාපදිංචි කරන ලද විවාහ, උප්පැන්න හා මරණ සංඛ්‍යාව 27
4. සහතික කළ පිටපත් නිකුත් කිරීම 28
5. වි.උ.ම ලේඛණ පරිවර්තන ඉල්ලීම් සංඛ්‍යාව 28
6. අනුමත කරන ලද ප්‍රකාශ පත්‍ර පිළිබඳ තොරතුරු 29
7. නිකුත් කරන ලද අනුමාන වයස් සහතික සංඛ්‍යාව 30
8. කොන්සියුලර් කර්තව්‍ය පනත යටතේ අනුමත කළ ප්‍රකාශ පත්‍ර සංඛ්‍යාව 30
9. උධෘත සහ පිටපත් ඉල්ලීම් 30
10. දරුකමට හදාවඩා ගැනීම් සම්බන්ධව තොරතුරු 31
11. මුද්දර ගාස්තු හා වෙනත් ගාස්තු 31

V වන පරිච්ඡේදය - ලියාපදිංචි හා ලේඛන සංරක්ෂණය සඳහා පරිගණක තොරතුරු තාක්ෂණය භාවිතයට හඳුන්වා දීම 32

VI වන පරිච්ඡේදය - දෙපාර්තමේන්තුවෙන් සපයනු ලැබූ විශේෂ සේවාවන්

1. ජනතා සත්කාරක සේවා 34
2. විශේෂ සේවාවන් 35
3. කාර්යාල පහසුකම් වැඩිදියුණු කිරීම 36
4. විදේශ පුහුණු 38

VII වන පරිච්ඡේදය - ඇගයීම් 39

ආදායම් ගිණුම් සාරාංශය 40

**මනුෂ්‍යත්වයෙන් පිරි රාජ්‍ය සේවයක පෙර ගමන් කරුවන් වෙමු........**



යහපාලනය සංකල්පය කේන්ද්‍රකරගත් සදාචාරාත්මක සමාජයක් ස්ථාපිත කිරීමේ අරමුණු පෙරදැරි කරගත් මෙම යුගය, ශ්‍රී ලාංකීය සමාජය අභිමුඛව ඇති සුවිශේෂ අවස්ථාවකි. එම අරමුණ සාක්ෂාත් කරගනු වස් සිවිල් පරිපාලනය සාධනීය ප්‍රතිසංස්කරණයන්ට ලක්කිරීමේ අවශ්‍යතාවය 2015 වසරේ දී අප විසින් සපුරා ගතයුතුව ඇති ප්‍රබලම අවශ්‍යතාවයයි.

ජනතා පරමාධිපත්‍ය ඉටුවන පරිදි යහපාලන සංකල්පය කේන්ද්‍රකරගෙන රාජ්‍ය සේවකයින් විසින් රජයේ සැලසුම් හා තීරණ ගැනීමේ ක්‍රියාවලියට දායක කරගැනීම රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ පුරවැසි අවශ්‍යතාවයන්ට වගවීමෙන් හා පාරදෘශ්‍යභාවයෙන් යුතුව ප්‍රතිචාර දැක්වීමක් වශයෙන් හඳුනා ගත හැකිය.

අභිනව රජයේ දින 100 වැඩ පිළිවෙළ යටතේ එළිදැක්වීමට නියමිත ව්‍යවස්ථා සංශෝධන, දිස්ත්‍රික් සහ ප්‍රාදේශීය පාලනය වඩාත් කාර්යක්ෂම සහ ඵලදායීව ක්‍රියාත්මක කිරීමේ ප්‍රායෝගික සැලසුම් නිර්මාණයටත් අදාළ ප්‍රධානතම වගකීම පැවරී තිබෙන්නේ රජයේ ප්‍රමුඛ අමාත්‍යාංශයක් වන ස්වදේශ කටයුතු අමාත්‍යාංශයටය.

21 වන ශතවර්ෂයට ගැලපෙන පරිදි නව තාක්ෂණික ක්‍රම උපයෝගී කරගනිමින් මූල්‍ය ප්‍රතිපත්ති අනුව කටයුතු කරමින් පුරවැසියන්ගේ බදු මුදල් වියදම් කරන ආකාරය සහ එහි කාර්ය සාධනය මැනීමට හැකිවන පරිදි ප්‍රසිද්ධ කිරීම වැදගත් කාර්යයක් වේ. මෙවැනි වාර්තා පුරවැසියන්ට පරිශීලනය කිරීම තුළින් අප වගවීමෙන්, පාරදෘශ්‍යභාවයකින්, ඵලදායීව හා කාර්යක්ෂමව කටයුතු කරන්නේද යන්න සම්බන්ධව තොරතුරු දැනගැනීම සඳහා වන අයිතිය තහවුරු කිරීමක් වේ.

රාජ්‍ය සේවයේ යුතුකම් හා වගකීම් ඉටුකරමින් මා හා එක්ව ජනහිතවාදී ආකර්ෂණීය සේවයක් ලබාදීමට කැපවෙන අමාත්‍යාංශ ලේකම් සහ රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ සමස්ථ කාර්ය මණ්ඩලයට ස්තූතිවන්ත වන අතර 2015 වසරේ ඉදිරි ඉලක්ක ජයගැනීමට එක්ව කණ්ඩායම් හැඟීමෙන් කටයුතු කිරීමට ඔබගේ දායකත්වය අපේක්ෂා කරමි.

එම්. ජෝශප් මයිකල් පෙරේරා (පාර්ලිමේන්තු මන්ත්‍රී)
ස්වදේශ කටයුතු අමාත්‍ය

**රාජ්‍ය සේවයේ යහපාලනය පෙරදැරිකරගත් හෙටක් වෙනුවෙන් ..............**



ස්වදේශ කටයුතු අමාත්‍යාංශය යනු මෙරට විශිෂ්ටතම හා සුවිශේෂී අමාත්‍යාංශයක් ලෙස හැඳින්වීම නිවැරදිය. දිවයින පුරාම විධිමත් පරිපාලනමය ව්‍යුහයකින් සහ පුළුල් ජාලයකින් සමන්විත වූ මෙම අමාත්‍යාංශය මගින් දිස්ත්‍රික් සහ ප්‍රාදේශීය සංවර්ධන කාර්ය සඳහා පුළුල් දායකත්වයක් සපයා ඇත. එසේම සංවර්ධන ක්‍රියාදාමයන්හි මහඟු ප්‍රතිඵල, බිම් මට්ටම දක්වා ගෙනයාමටද ඉවහල් වී ඇත.

2014 වර්ෂය තුළ රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව විසින් ඉටු කරන ලද මෙහෙවර ඇතුළත් "වාර්ෂික කාර්යසාධන හා ගිණුම් වාර්තාව" වෙත පණිවිඩයක් නිකුත් කිරීමට ලැබීම මා ලද භාග්‍යයක් ලෙස සලකමි.

පසුගිය වසර පුරාවට රාජ්‍ය අංශයේ කටයුතු විධිමත් කිරීමෙහි ලා රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව විසින් සිදුකළ සේවය අතිශයින් වැදගත්වේ. ඒ සඳහා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය යටතේ පවතින රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව විසින් විශිෂ්ට දායකත්වයක් ලබාදී ඇති බව සිහිපත් කරන්නේද ස්තූති පූර්වකවය.

ස්වදේශ කටයුතු අමාත්‍යාංශය යටතේ ඇති රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව පුළුල් ජනතා සේවයක් වෙනුවෙන් කැපවී සිටී. 21 වන ශතවර්ෂයට ගැලපෙන පරිදි ජනතා අපේක්ෂා ඉටුකිරීමෙහිලා සමීප සේවාවක් ලබාදීම සඳහා නවීන තොරතුරු තාක්ෂණය යොදාගැනීමටද රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව කටයුතු කර තිබේ.

මෙතෙක් ආ ගමන් මඟ තුළ අප ලත් අත්දැකීම් පෙරදැරි කරගෙන ඉදිරියටත් මහජනතාව වෙත කාර්යක්ෂමවූත්, ඵලදායීවූත් රාජ්‍ය සේවයක් ඉටු කිරීම සඳහා 2015 ජනවාරි මස සිට "ස්වදේශ කටයුතු අමාත්‍යාංශය" නමින් රටේ පරිපාලනය ව්‍යුහය යහපාලනය හා සංවර්ධනය සඳහා අප අමාත්‍යාංශයේ උපරිම දායකත්වය ලබාදීම රාජ්‍ය සේවයේ විශිෂ්ඨයන් වන ඔබගෙන් උදක්ම බලාපොරොත්තු වෙමු. ඒ රාජ්‍ය සේවයේ විශිෂ්ටත්වය පෙන්වන හෙටක් වෙනුවෙනි.

එස්.ඩී.ඒ.බී. බොරලැස්ස
ලේකම්
ස්වදේශ කටයුතු අමාත්‍යාංශය

# රෙජිස්ට්‍රාර් ජනරාල්තුමාගේ පණිවිඩය . . .



වර්ෂ 1864 දී පිහිටුවනු ලැබූ මෙම දෙපාර්තමේන්තුව දැනට වසර 151 ක ප්‍රෞඪ ඉතිහාසයකට උරුම කම් කියමින් ලේඛන ලියාපදිංචි කිරීම, මහජනතාවගේ සිවිල් අයිතිවාසිකම් ලියාපදිංචි කිරීම මෙන් ම වර්තමානයේ දී හිමිකම් ලියාපදිංචි කිරීම තුළින් සහශ්‍රය ජය ගැනීමට මෙම දෙපාර්තමේන්තුවෙන් සලසනු ලබන සේවාවන් වඩාත් කාර්යක්ෂමව ඉටු කිරීම සඳහා අවශ්‍ය මං පෙත් එළි පෙහෙළි කරමින් සිටී. මේ සඳහා ගරු ස්වදේශ කටයුතු අමාත්‍යතුමාගේ සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ මඟපෙන්වීම මහඟු පිටිවහලක් වී තිබේ.

ලේඛන ලියාපදිංචිය හා හිමිකම් ලියාපදිංචිය සඳහා දිවයින පුරා පිහිටුවා ඇති ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල 45 ක් මගින් මහජනතාවට අවශ්‍ය සේවාවන් ඉටු කරනු ලබයි. 1998 වර්ෂයේ අංක 21 දරණ ඉඩම් හිමිකම් ලියාපදිංචි කිරීමේ පනත යටතේ ඉඩම් හිමිකම් ලියාපදිංචි කිරීමද මෙම දෙපාර්තමේන්තුවට පැවරී ඇති රාජකාරියකි.

1867 වර්ෂයේ දී මහජනතාවගේ සිවිල් අයිතීන් වූ විවාහ , උප්පැන්න සහ මරණ ලියාපදිංචි කිරීමේ කටයුතු ද පැවරුණි. 1992 වර්ෂයේ දී වඩාත් කඩිනම් සේවයක් සැපයීමත් වඩාත් පහසුවෙන් කටයුතු ඉටු කර ගැනීමට පහසුවීමත් සඳහා සිවිල් ලියාපදිංචි කිරීමේ කටයුතු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ දක්වා විමධ්‍යගත කරන ලදී. ඒ අනුව දිවයින පුරා ඇති ප්‍රාදේශීය ලේකම් කාර්යාල 330 ක් මගින් සිවිල් ලියාපදිංචි කිරීමට අදාල කටයුතු ඉටු කිරීම සඳහා නවීන තාක්ෂණය යොදා ගැනීම වේගවත් කර ඇති අතර එතුළින් විවාහ , උප්පැන්න සහ මරණ සහතික පරිලෝකනය කර ඉතා කෙටි වේලාවකින් සහතික පිටපත් නිකුත් කිරීමේ වැඩසටහනක් ද ආරම්භ කර ඇත. මෙම සිවිල් ලියාපදිංචි කිරීමේ කටයුතු අධීක්ෂණය සහ ව්‍යවස්ථාපිත කාර්යයන් ඉටු කිරීම සඳහා කලාප කාර්යාල 07ක් මගින් වඩාත් සමීප කඩිනම් සේවාවන් සැපයීමේ පුරෝගාමී දෙපාර්තමේන්තුවක් ලෙස ඉදිරියට ගමන් කරමින් සිටී.

එමෙන්ම මේ වන විට බොහොමයක් ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාල එක් දිනකදි ඔප්පු ලියාපදිංචි කිරිම සිදු කරන අතර දෙපාර්තමේන්තු වෙබ් අඩවියේ මුල් පිටුවේ සපයා ඇති ඔප්පු ලියාපදිංචි කිරිම යටතේ අදාල තොරතුරු ඇතුලත් කිරීමෙන් අදාල ඔප්පු ලියාපදිංචි වී ඇතිදැයි යන වග දැනගත හැකිවීම තුලින්ද ජනතාවගේ කටයුතු පහසු කරලීමට අපහට හැකිවී තිබීම ඉමහත් සතුටක් ගෙන දෙන්නකි.

එලෙස ඉහත කටයුතු මෙතෙක් ඉතා සාර්ථකව ඉටු කරගෙන ආ නමුත් වර්තමාන ලෝකය හා ගැටෙමින් විද්‍යුත් තාක්ෂණික රාජ්‍ය සේවයක් ඇති කිරීමේ රාජ්‍ය ප්‍රතිපත්තිය යටතේ,

1. e-BMD ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම.
2. e-LR ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම.
3. මහජනතාවගේ අවශ්‍යතාවයන් සඳහා උපදෙස් ලබා දීම සඳහා විද්‍යුත් වෙබ් අඩවිය මගින් ද අවස්ථාව උදා කර දී ඇති අතර ,ඒ තුළින් මෙම දෙපාර්තමේන්තුවෙන් සපයනු ලබන සේවාවන් පිළිබඳව ජාත්‍යන්තර ප්‍රජාව මෙන් ම දේශීය ප්‍රජාව ද දැනුවත් කිරීම.

යන කටයුතු සාර්ථක ලෙස පවත්වාගෙන යනු ලබයි. එමගින් පෙරටත් වඩා ජනතාවට කාර්යක්ෂම, නිරවුල් සහ සුහදශීලී රාජ්‍ය සේවයක් සැලසෙන බව අපගේ විශ්වාසයයි.

ආර්.එම්. ගුණසේකර

රෙජිස්ට්‍රාර් ජනරාල්

# දෙපාර්තමේන්තුවේ ව්‍යුහය

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව ප්‍රධාන කාර්යාලය

### කලාප කාර්යාල 07

- 01 උතුර කලාප කාර්යාලය
- 02 නැගෙනහිර කලාප කාර්යාලය
- 03 දකුණ කලාප කාර්යාලය
- 04 බස්නාහිර කලාප කාර්යාලය
- 05 මධ්‍යම කලාප කාර්යාලය
- 06 ඌව සබරගමුව කලාප කාර්යාලය
- 07 වයඹ උතුරු මැද කලාප කාර්යාලය

### මධ්‍යම ලේඛනාගාරය

### ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාල 45

- 01 අම්පාර
- 02 අනුරාධපුරය
- 03 අත්තනගල්ල
- 04 අවිස්සාවේල්ල
- 05 බදුල්ල
- 06 බලපිටිය
- 07 මඩකලපුව
- 08 හලාවත
- 09 කොළඹ
- 10 දෙල්කඳ/නුගේගොඩ
- 11 ඇල්පිටිය
- 12 ඇඹිලිපිටිය
- 13 ගම්පොල
- 14 ගම්පහ
- 15 ගාල්ල
- 16 හෝමාගම
- 17 හොරණ
- 18 හම්බන්තොට
- 19 යාපනය
- 20 කළුතර
- 21 කල්මුණේ
- 22 කිලිනොච්චිය
- 23 කුරුණෑගල
- 24 කුලියාපිටිය
- 25 කෑගල්ල
- 26 කොටපොල
- 27 මහනුවර
- 28 මතුගම
- 29 මාතලේ
- 30 මන්නාරම
- 31 මාතර
- 32 මාරවිල
- 33 මොණරාගල
- 34 මුලතිව්
- 35 මීගමුව
- 36 නුවරඑළිය
- 37 නිකවැරටිය
- 38 පානදුර
- 39 පුත්තලම
- 40 පේදුරුතුඩුව
- 41 පොළොන්නරුව
- 42 රත්නපුර
- 43 තංගල්ල
- 44 ත්‍රිකුණාමලය
- 45 වව්නියාව

### ප්‍රාදේශීය ලේකම් කාර්යාල 320
(දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් අංශය)

## අපගේ දැක්ම...

ලියාපදිංචිය තුළින් අයිතිවාසිකම් ආරක්ෂා කර

ගැනීමට ජනතාවට සහාය වීම.

## අපගේ මෙහෙවර ...

ශ්‍රී ලංකාවේ

නිශ්චල හා චංචල දේපළ වලට

අදාල නීත්‍යානුකූල ලේඛන හා

හිමිකම් ලියාපදිංචි කිරීම සහ

ජන ජීවිතයේ මූලික ගෘහස්ථ

සිදුවීම් වන

විවාහ, උපත් සහ මරණ

ලියාපදිංචි කිරීමෙන්ද,

එම ලේඛන සංරක්ෂණය කිරීම

සහ එම ලේඛන වලින් සහතික

පිටපත් නිකුත් කිරීමෙන්ද,

අයිතීන් රැක ගැනීම පිණිස

ජනතාවට සහාය වීම.

# I පරිච්ඡේදය

<u>කාර්යයන්</u>

ප්‍රධාන කාර්යයන් තුනකි.

1) ලියාපදිංචි කිරීම.
2) භාරකාරත්වය සහ ලේඛන සංරක්ෂණය.
3) සහතික පිටපත් නිකුත් කිරීම.

<u>ක්‍රියාකාරකම්</u>

1. **ලියාපදිංචි කිරීම**

1. 1 **ලේඛණ ලියාපදිංචි කිරීම**

1. නිශ්චල (ඉඩම්) දේපළ වලට අදාළ ලේඛණ ලියාපදිංචි කිරීම
2. චංචල දේපළ වලට අදාළ ලේඛණ ලියාපදිංචි කිරීම
3. ඇටෝර්නි බලපත්‍ර ලියාපදිංචි කිරීම

1.2 **හිමිකම් ලියාපදිංචි කිරීම**

1. නිශ්චල දේපළ වලට අදාළ හිමිකම් ලියාපදිංචි කිරීම

1.3 **සිවිල් ලියාපදිංචි කිරීම**

1. ශ්‍රී ලංකාව තුළ සිදුවන සියලුම විවාහ, උපත් හා මරණ ද, විදේශයන්හි දී සිදුවන ශ්‍රී ලාංකිකයන්ගේ විවාහ, උපත් සහ මරණ ද ලියාපදිංචි කිරීම.
2. ළමයින් දරු කමට හදා ගැනීමේ අධිකරණ නියෝග ලියාපදිංචි කිරීම සහ එම ළමයින්ගේ උපත නැවත ලියාපදිංචි කිරීම.
3. උඩරට විවාහ, හා දික්කසාද ඉල්ලීම් මත තීරණ ගැනීම.
4. උඩරට විවාහ දික්කසාද ලියාපදිංචි කිරීම.

**2. භාරකාරත්වය හා සංරක්ෂණය**

ඉහත ලේඛණ, නොතාරිස් දෙවන පිටපත් හා සංරක්ෂණය කළ යුතු අනෙකුත් ලියවිලි හා ලේඛණ වල භාරකාරත්වය සහ සංරක්ෂණය කිරීම.

**3. සහතික පිටපත් නිකුත් කිරීම**

සහතික පිටපත් නිකුත් කිරීමට නියමිත සියළු ලේඛණ වල සහතික කළ පිටපත් එසේ ලබා ගැනීමට බලය ලත් පුද්ගලයින්ට නිකුත් කිරීම.

<u>අනුෂාංගික ක්‍රියාකාරකම්</u>

1. විවාහ, උප්පැන්න හා මරණ රෙජිස්ට්‍රාර්වරුන් පත් කිරීම හා පාලනය.
2. නොතාරිස්වරුන් පත් කිරීම හා පාලනය.
3. ඔප්පු මත හා වෙනත් ලියවිලි මත නියමිත මුද්දර ගාස්තු ගෙවන බවට සහතික වීම.
4. සහතික පිටපත්වල පරිවර්තන නිකුත් කිරීම.
5. සංශෝධන කිරීම.
6. ජීව සංඛ්‍යාති වාර්තා ප්‍රකාශයට පත් කිරීම.
7. නිවාඩු ආඥා පනත ක්‍රියාත්මක කිරීම.

## <u>පනත් සහ ආඥා පනත්</u>

- **ඉඩම් ලියාපදිංචි කිරීම**

1. ලේඛණ ලියාපදිංචි කිරීමේ ආඥා පනත
2. සන්නස් සහ පැරණි ඔප්පු ආඥා පනත
3. පැරණි ඔප්පු හා ලියවිලි ලියාපදිංචි කිරීමේ ආඥා පනත
4. ඉඩම් ලේඛණ (පත්ඉරු නැවත සකස් කිරීමේ) ආඥා පනත
5. නොතාරිස් ආඥා පනත
6. හිමිකම් ලියාපදිංචි කිරීමේ පනත
7. ඇටෝර්නි බලපත්‍ර ආඥා පනත
8. බද්ධ නිවාස අයිතිවාසිකම් පනත
9. මුද්දර ගාස්තු පනත
10. මුදල් පනත

- **විවාහ,උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීම**

1. උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ පනත
2. මරණ ලියාපදිංචි කිරීමේ (විශේෂ විධිවිධාන) පනත
3. විවාහ (සාමාන්‍ය) ලියාපදිංචි කිරීමේ ආඥා පනත
4. උඩරට විවාහ දික්කසාද පනත
5. උඩරට අනුප්‍රප්තික ආඥා පනත
6. මුස්ලිම් විවාහ හා දික්කසාද පනත
7. ළමයින් දරුකමට හදා ගැනීමේ පනත

# දෙපාර්තමේන්තු කාර්ය මණ්ඩලය

**2014.12.31** දිනට

| සේවය | අනුමත සංඛ්‍යාව | දැනට සිටින සංඛ්‍යාව |
|---|---|---|
| රෙජිස්ට්‍රාර් ජනරාල් | 01 | 01 |
| අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල් (පාලන) | 01 | - |
| ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය රෙජිස්ට්‍රාර් ජනරාල් (පාලන) | 01 | 01 |
| ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය රෙජිස්ට්‍රාර් ජනරාල් | 02 | - |
| නියෝජ්‍ය රෙජිස්ට්‍රාර් ජනරාල්<br>සහකාර රෙජිස්ට්‍රාර් ජනරාල්<br>සහකාර රෙජිස්ට්‍රාර් ජනරාල් (පාලන) | -<br>31<br>01 | 01<br>04<br>- |
| ගණකාධිකාරී I<br>ගණකාධිකාරී I I I<br>ගණකාධිකාරී (අභ්‍යන්තර විගණන) | 01<br>02<br>01 | 01<br>02<br>- |
| සහකාර අධ්‍යක්ෂ (තොරතුරු තාක්ෂණ) | 01 | - |
| නීති නිලධාරී | 01 | - |
| ඉඩම් රෙජිස්ට්‍රාර්/හිමිකම් රෙජිස්ට්‍රාර් | 49 | 56 |
| පරිපාලන නිලධාරී | 01 | - |
| භාෂා පරිවර්තක | 01 | - |
| තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නිලධාරී | 02 | - |
| රෙජිස්ට්‍රාර් සේවය III | 537 | 506 |
| සංවර්ධන නිලධාරී | 400 | 387 |
| අයවැය සහකාර | 01 | - |
| කාර්මික නිලධාරී | 01 | - |
| රාජ්‍ය කළමනාකරණ සහකාර | 946 | 640 |
| තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහකාර | 12 | 12 |
| ලේඛණ සහකාර | 209 | 206 |
| පොත් බැඳුම්කරු | 75 | 39 |
| රියදුරු | 18 | 16 |
| කාර්යාල කාර්ය සහායක | 369 | 369 |

## ලේඛන ලියාපදිංචි කිරීමෙන් අයිතිවාසිකම් ආරක්ෂා කිරීමට සහාය වෙමු.



# II වන පරිච්ඡේදය

## ලේඛණ ලියාපදිංචි කිරීම

### 01. නොතාරිස්වරුන් පිළිබඳ විස්තර

2014 වර්ෂය තුළ කටයුතු කළ නොතාරිස් වෘත්තියේ යෙදුනු නීතිඥ සහ නීතිඥ නොවන නොතාරිස්වරුන්ගේ ගණන සහ ඔවුන් පිළිබඳ විස්තර පහත දැක්වේ.

| | | නීතිඥ නොතාරිස්වරු | නීතිඥ නොවන නොතාරිස්වරු | මුළු ගණන |
|---|---|---|---|---|
| 1. | 2014 වර්ෂය තුළ අළුතින් වෘත්තීය ආරම්භ කළ ගණන | 790 | 1 | 791 |
| 2. | වසර තුළ ඉල්ලා අස් වූ ගණන | 42 | - | 42 |
| 3. | වසර තුළ කටයුතු අත්හිටවූ ගණන | 2 | - | 2 |
| 4. | වසර තුළ මිය ගිය ගණන | 25 | 7 | 32 |
| 5. | 2014.12.31 දිනට වෘත්තියේ යෙදී සිටි ගණන | 11049 | 414 | 11463 |

### 02. 2014 වර්ෂය තුළ නිකුත් කළ නොතාරිස් බලපත්‍ර සංඛ්‍යාව

1. අලුතින්ම නිකුත් කළ නොතාරිස් බලපත්‍ර සංඛ්‍යාව - 488
2. අතිරේක භාෂාවෙන් කටයුතු කිරීම සඳහා - 342
3. අධිකරණ කලාපය වෙනස් කර ගැනීම සඳහා - 159

**03. ඉඩම් ලේඛන ලියාපදිංචි කිරීමේ දෝෂ නිවැරදි කිරීම.**

1. 2014 වර්ෂය සඳහා ලද ඉල්ලීම් සංඛ්‍යාව - 2,359
2. 2014 වර්ෂය සඳහා වැඩ අවසන් කළ සංඛ්‍යාව - 2,206

**04. දිරාපත් ඉඩම් ලේඛණ නැවත සකස් කිරීම**

1. ලද ඉල්ලීම් සංඛ්‍යාව - 76
2. අනුමත කරන ලද සංඛ්‍යාව - 31

**05. ලියාපදිංචිය**

1. 2014 වර්ෂය තුළ ලියාපදිංචියට ලද ඔප්පු සංඛ්‍යාව - 1,042,233
2. 2014 වර්ෂය තුළ ලියාපදිංචියට ලද ඇටෝර්නි බලපත්‍ර සංඛ්‍යාව - 43,515
3. 2014 වර්ෂය තුළ ලියාපදිංචියට ලද හිමිකම් උපලේඛණ සංඛ්‍යාව - 62,052









## 06. ලේඛණ සංරක්ෂණය

වර්ෂය තුළ ලද ඔප්පු දෙවන පිටපත් සංඛ්‍යාව - 762,167




2014 වර්ෂයේදී සංරක්ෂණය සඳහා ලද ඔප්පු දෙවන පිටපත් සංඛ්‍යාව 2013 වර්ෂයට වඩා 44.14% කින් අඩු වී ඇත.

## 07. (අ) සහතික පිටපත් ලබා ගැනීමට ලද ඉල්ලුම් පත්‍ර සංඛ්‍යාව

| | | |
|---|---|---|
| 1. ඉඩම් ලේඛණ උධෘත | - | 805,483 |
| 2. ඔප්පු පිටපත් | - | 150,862 |
| 3. ඇටෝර්නි බලපත්‍ර | - | 1,233 |
| 4. හිමිකම් සහතික | - | 6,548 |




2013 වර්ෂයට සාපේක්ෂව 2014 වර්ෂය වන විට ඉඩම් ලේඛණ උධෘත සහතික පිටපත් ලබා ගැනීම සඳහා ලද ඉල්ලීම් සංඛ්‍යාව 20.53 %කින් වැඩි වී ඇති අතර ඔප්පු පිටපත් සහතික පිටපත් ලබා ගැනීම සඳහා ලද ඉල්ලීම් සංඛ්‍යාව 4.86%කින් අඩු වී ඇත.

**(ආ) ලේඛණ සෙවීමට ලද ඉල්ලුම් පත්‍ර සංඛ්‍යාව**

| | | |
|---|---|---|
| 1. ඉඩම් ලේඛණ | - | 118,013 |
| 2. ඔප්පු හා වෙනත් ලේඛණ | - | 3,455 |




2013 වර්ෂයට සාපේක්ෂව 2014 වර්ෂය වන විට ඉඩම් ලේඛණ සෙවීමට ලද ඉල්ලීම් සංඛ්‍යාව 8.72% කින් අඩු වී ඇති අතර ඔප්පු හා වෙනත් ලේඛණ සෙවීම සඳහා ලද ඉල්ලීම් සංඛ්‍යාව 11.7% කින් වැඩි වී ඇත.

## 08. දෙපාර්තමේන්තුව විසින් අයකර ගන්නා ලද ගාස්තු ප්‍රමාණයන්

| | කාරණය | ගාස්තු (රු.) |
|---|---|---|
| 1. | ඔප්පු හා වෙනත් ලේඛනවල දෙවන පිටපත්වලට අලවන ලද මුද්දර ගාස්තු | 15,746,932,090.00 |
| 2. | පුරවැසියන් නොවන පුද්ගලයන්ට දේපල පැවරීමේ බදු මුදල් | 96,498,968.32 |
| 3. | ලේඛණ ලියාපදිංචි කිරීමේ ආඥා පනත හා ඇටෝර්නි බලපත්‍ර ආඥා පනත යටතේ අය කළ ගාස්තු | 453,776,041.50 |

## ඔබේ ඉඩමේ හිමිකම අපි වඩාත් තහවුරු කරන්නෙමු...

බිම් සවිය



# III වන පරිච්ඡේදය

## හිමිකම් ලියාපදිංචි කිරීම

1998 අංක 21 දරණ හිමිකම් ලියාපදිංචි කිරීමේ පනතට අනුව ලේඛණ ලියාපදිංචි කිරීමේ ක්‍රමය වෙනුවට හිමිකම් ලියාපදිංචි කිරීමේ වැඩසටහන ආරම්භ කර ඇත. මෙම වැඩසටහන ශ්‍රී ලංකාව තුළ “බිම්සවිය වැඩසටහන” නමින් මේ වන විට ආරම්භ කර ඇත. ඒ අනුව මේ වන විට රාජ්‍ය මූල්‍ය ප්‍රතිපාදන යටතේ මෙරට ප්‍රමුඛ පෙළේ සංවර්ධන වැඩසටහනක් ලෙස බිම්සවිය වැඩසටහන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් ක්‍රියාත්මක වෙමින් පවතී.

මෙම වැඩසටහන යටතේ 2014 වර්ෂය තුළ ගාල්ල, මාතර, අත්තනගල්ල, මාරවිල සහ කළුතර ඉඩම් කාර්යාලවල හිමිකම් ලියාපදිංචි කිරීම ආරම්භ කිරීමට හැකි වූ අතර 2014 වර්ෂය තුළ හිමිකම් ලියාපදිංචි කිරීම ක්‍රියාත්මක වන කාර්යාල සහ ඒ එක් එක් කාර්යාලවලින් ලියාපදිංචි කරන ලද ඉඩම් කැබලි ප්‍රමාණය පහතින් සඳහන් කර ඇත.

| | වර්ෂයේ ලියාපදිංචි කර ඇති ඉඩම් කැබලි ප්‍රමාණය | 2014 අවසන් වන විට ලියාපදිංචි කර ඇති මුළු ඉඩම් කැබලි ප්‍රමාණය |
|---|---|---|
| අනුරාධපුරය | 1384 | 50944 |
| ගම්පහ | 1015 | 19449 |
| ගම්පොළ | 301 | 28466 |
| මීගමුව | 1872 | 38509 |
| රත්නපුර | 5689 | 46080 |
| හෝමාගම | 6958 | 48371 |
| හම්බන්තොට | 1569 | 22947 |
| මහනුවර | 5454 | 22507 |
| දෙල්කඳ | 8590 | 43360 |
| කුරුණෑගල | 2203 | 19897 |
| මොණරාගල | 1138 | 13668 |
| බදුල්ල | 1025 | 9746 |
| පොළොන්නරුව | 1375 | 17475 |
| ත්‍රිකුණාමලය | 26 | 887 |
| මාතලේ | 1953 | 6901 |

| | | |
|---|---|---|
| කුලියාපිටිය | 1428 | 4133 |
| නුවරඑළිය | 812 | 3450 |
| පානදුර | 1108 | 2119 |
| ගාල්ල | 1739 | 1739 |
| මාතර | 1504 | 1504 |
| අත්තනගල්ල | 2735 | 2735 |
| මාරවිල | 243 | 243 |
| කළුතර | 670 | 670 |
| එකතුව | 50,791 | 405,800 |

2014 වර්ෂය තුල ලියාපදිංචිය සඳහා 62052 ක හිමිකම් උපලේඛණ ප්‍රමාණයක් ලැබී තිබෙන අතර ලියාපදිංචි කල මුළු හිමිකම් උපලේඛණ ප්‍රමාණය 50791ක් වේ.

**පුහුණු වැඩ සටහන්**

බිම්සවිය වැඩසටහන සම්බන්ධයෙන් ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍යාංශයේ මෙහෙයවීමෙන් සහ හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුවේ සංවිධානයෙන් පවත්වනු ලබන සෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල දැනුවත් කිරීමේ වැඩසටහන්වලට සහ ගම් මට්ටමින් සංවිධානය කරනු ලබන ප්‍රජාව දැනුවත් කිරීමේ වැඩසටහන්වලට ද මෙම දෙපාර්තමේන්තුවේ දායකත්වය ලබා දී ඇත.

නව මෘදුකාංගය භාවිතයෙන් හිමිකම් ලියාපදිංචිය සිදු කිරීම සම්බන්ධව හිමිකම් කාර්යාලවල නිලධාරීන් පුහුණු කිරීමේ වැඩසටහන් වරින් වර ප්‍රධාන කාර්යාලයේදී පවත්වන ලදී.

**මූල්‍ය සහ යටිතල පහසුකම්**

2014 වර්ෂයේ දී නව හිමිකම් ලියාපදිංචි කිරීමේ මෘදුකාංගය වැඩි දියුණු කර හිමිකම් ලියාපදිංචි කිරීම එම මෘදුකාංගය මඟින් සිදු කිරීම ආරම්භ කරන ලද අතර ඒ සඳහා රු 1,450,000 ක මුදලක් වැය කරන ලදී.

eland register වැඩසටහන යටතේ කොළඹ, දෙල්කඳ, ගම්පහ, අත්තනගල්ල, යාපනය සහ මන්නාරම යන ඉඩම් කාර්යාලවල ඉඩම් ලේඛන පරිලෝකනය කර දත්ත ඇතුලත් කිරීම සිදු කෙරෙන අතර ඒ සඳහා රු 29,255,386.50 ක මුදලක් වැය කෙරුණි.

එමෙන්ම 2014 වර්ෂය අවසානයේ දී හිමිකම් ලියාපදිංචි කිරීමේ ආදායම රු 12,009,751.50 ක් වූ අතර රු 4,803,900.60 ක මුදලක් පසුගනුදෙනු සාධන පත්‍ර ලියාපදිංචි කිරීම තුලින් හිමිකම් රක්ෂණ අරමුදලට බැරකිරීමට හැකිවිය. එසේම 2013 වර්ෂයට වඩා 2014 වර්ෂය තුල රු 1,051,652 ක මුදලක් රක්ෂණ අරමුදලට බැර කිරීමට හැකියාව ලැබුණි. 2014 වර්ෂයේ හිමිකම් ලියාපදිංචි කිරීමේ ආදායමෙන් රු 4,303,970.87 ක මුදලක් භාණ්ඩාගාර බිල්පත්වල ආයෝජනය කිරීමට හැකියාව ලැබුණි.

පසුගිය පස්වසරක කාලය තුළ බිම්සවිය වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා මෙම දෙපාර්තමේන්තුවට ලැබී ඇති ප්‍රතිපාදන සහ වියදම පහත දැක්වේ.



**පසුගනුදෙනු ලියාපදිංචි කිරීමේ ප්‍රගතිය**

බිම්සවිය වැඩසටහන යටතේ 2013 වර්ෂයේ පසු ගනුදෙනු සාධන පත්‍ර 13,492 ක් ද 2014 වර්ෂයේ පසු ගනුදෙනු සාධන පත්‍ර 17,479 ක්ද ලියාපදිංචි කරන ලදී. මෙම වැඩසටහන යටතේ ලියාපදිංචි කරන ලද පසු ගනුදෙනු සංඛ්‍යාව 2013 වර්ෂයට සාපේක්ෂව 2014 වර්ෂයේ 30% කින් ද වර්ධනය වී ඇත. මෙම වැඩසටහන යටතේ හිමිකම් කාර්යාල 23 හි ලියාපදිංචි කරන ලද ලියාපදිංචි කරන ලද පසු ගනුදෙනු සංඛ්‍යාව පහත දැක්වේ.




## දෙපාර්තමේන්තුව විසින් අයකර ගන්නා ලද ගාස්තු ප්‍රමාණයන්

| | කාරණය | ගාස්තු (රු.) |
|---|---|---|
| 1. | හිමිකම් ලේඛණ උධෘත සහ හිමිකම් සහතික පිටපත් නිකුත් කිරීමේ ගාස්තු | 11,390,595.00 |
| 2. | හිමිකම් සාධන පත්‍ර වෙනුවෙන් පළාත් පාළන ආයතන වලට හෝ රජයට අය කරන ලද මුද්දර ගාස්තු | 289,811,255.97 |

## විවාහ උපත් සහ මරණ ලියාපදිංචි කිරීමෙන් අයිතිවාසිකම් ආරක්ෂා කිරීමට සහාය දෙමු



# IV වන පරිච්ඡේදය

## සිවිල් ලියාපදිංචි කිරීම

### 01. රෙජිස්ට්‍රාර්වරු

2014.12.31 දිනට සේවයේ යෙදී සිටි රෙජිස්ට්‍රාර්වරුන්ගේ ගණන 1730 කි. ඔවුහු පහත සඳහන් වර්ග වලට අයත් වේ.

| | | |
|---|---|---|
| 1. | විවාහ , උප්පැන්න සහ මරණ රෙජිස්ට්‍රාර්වරු | 814 |
| 2. | විවාහ (අතිරේක) රෙජිස්ට්‍රාර්වරු | 493 |
| 3. | උප්පැන්න හා මරණ වෛද්‍ය රෙජිස්ට්‍රාර්වරු | 85 |
| 4. | උප්පැන්න හා මරණ රෙජිස්ට්‍රාර්වරු | 45 |
| 5. | මුස්ලිම් විවාහ රෙජිස්ට්‍රාර්වරු | 293 |
| | **මුළු ගණන** | **1,730** |

### 02. 2014 වර්ෂය තුළ ලියාපදිංචි කරන ලද විවාහ, උපත් සහ මරණ සංඛ්‍යාව

1) විවාහ - 175,728
2) උපත් - 349,715
3) මරණ - 127,758




2014 වර්ෂය තුළ ලියාපදිංචි කරන ලද විවාහ, උපත් සහ මරණ සංඛ්‍යා 2013 වර්ෂයට සාපේක්ෂව පිළිවෙලින් 1.29%කින්, 4.88% කින් සහ 0.62%කින් අඩු වීමක් පෙන්වයි.

**03. 2014 වර්ෂය තුළ විදේශයන්හි පිහිටි ශ්‍රී ලංකා තානාපති කාර්යාල මගින් ලියාපදිංචි කරන ලද විවාහ , උප්පැන්න හා මරණ සංඛ්‍යාව**

1) විවාහ - 84
2) උපත් - 5,163
3) මරණ - 314




**04.** විවාහ,උප්පැන්න සහ මරණ සහතික සහ අනුමාන වයස් සහතික පිටපත් ලබා ගැනීම සඳහා ලද ඉල්ලුම් පත්‍ර සංඛ්‍යාව - 2,034,032

**04.** වි.උ.ම ලේඛණ පරිවර්තන ඉල්ලීම්

| ලේඛණය | ඉල්ලුම් පත් සංඛ්‍යාව | නිකුත් කළ පිටපත් සංඛ්‍යාව |
|---|---|---|
| විවාහ,උප්පැන්න සහ මරණ | 34,468 | 53,927 |




2014 වර්ෂයේ විවාහ, උප්පැන්න සහ මරණ සහතික පරිවර්තනය සඳහා ලද ඉල්ලීම් සංඛ්‍යාව 2013 වර්ෂයට වඩා 1.41% කින් වැඩි වී ඇත.

## 06. අනුමත කරන ලද ප්‍රකාශ පත්‍ර පිළිබඳ තොරතුරු

| කාරණය | ලද ප්‍රකාශ පත්‍ර සංඛ්‍යාව |
|---|---|
| පසුගිය උපත් ලියාපදිංචි කිරීම. | 25,608 |
| නම් වෙනස් කිරීම් හා සංශෝධන කිරීම. | 37,297 |
| පසුගිය මරණ ලියාපදිංචි කිරීම. | 5,257 |
| ලිපි දෝෂ හා වෙනත් අනුශාංගික තොරතුරු නිවැරදි කිරීම. | 14,142 |

**07.** නිකුත් කරන ලද අනුමාන වයස් සහතික සංඛ්‍යාව - **3,602**

**08. 2014** වර්ෂය තුළ විදේශයන්හි පිහිටි ශ්‍රී ලංකා තානාපති කාර්යාල මගින් ලද ප්‍රකාශ පත්‍ර මත අනුමත කළ ප්‍රකාශ පත්‍ර සංඛ්‍යාව

| වගන්තිය | ලද ප්‍රකාශ පත්‍ර සංඛ්‍යාව | අනුමත කළ ප්‍රකාශ පත්‍ර සංඛ්‍යාව |
|---|---|---|
| 24 | 2243 | 2243 |
| 27 | 157 | 151 |
| 27ඒ | 79 | 78 |
| 36 | 451 | 451 |
| 52 | 99 | 98 |

**09.** විදේශයන්හි පිහිටි ශ්‍රී ලංකා තානාපති කාර්යාල මගින් ලද උධෘත සහ පිටපත් පිළිබඳ ඉල්ලීම්

| වගන්තිය | ලද ඉල්ලීම් සංඛ්‍යාව |
|---|---|
| උපත් හා මරණ ලියාපදිංචි කිරීමේ පනත | 26,982 |
| විවාහ (සාමාන්‍ය) ලියාපදිංචි කිරීමේ පනත | 95 |
| උඩරට විවාහ සහ දික්කසාද පනත | 36 |
| මුස්ලිම් විවාහ සහ දික්කසාද පනත | 105 |

## 10. දරුකමට හදාවඩා ගැනීම් සම්බන්ධව තොරතුරු

1) දරුකමට හදා වඩා ගැනීමේ ආඥා පනත යටතේ අධිකරණය මගින් නිකුත් කරන ලද නියෝග සංඛ්‍යාව - 1,357

2) දරුකමට හදාවඩා ගැනීමේ සහතික පිටපත් - 1,363

3) දරුකමට හදාවඩා ගත් ළමයින්ගේ උපත් ලියාපදිංචිය - 1,019




## 11. මුද්දර ගාස්තු හා වෙනත් ගාස්තු

2014 වර්ෂය තුළ විවාහ, උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීම සම්බන්ධයෙන් අය කර ගන්නා ලද මුද්දර ගාස්තු හා වෙනත් ගාස්තු පහත දැක්වේ.

| | කාරණය | රු. |
|---|---|---|
| 1 | උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ පනත, විවාහ (සාමාන්‍ය) ලියාපදිංචි කිරීමේ පනත, උඩරට විවාහ සහ දික්කසාද පනත හා මුස්ලිම් විවාහ සහ දික්කසාද පනත යටතේ අය කර ගත් ගාස්තු | 583,210,650.00 |

# V වන පරිච්ඡේදය

## උප්පැන්න , මරණ සහ විවාහ සහතික පරිගණක ගත කිරීම.

## e-BMD

උප්පැන්න , මරණ සහ විවාහ සහතික පරිලෝඛනය කර පරිගණක භාවිතයෙන් සහතික පිටපත් නිකුත් කිරීම මේ යටතේ කරනු ලැබේ. 2014 වර්ෂය අවසාන වන විට පහත දැක්වෙන ප්‍රාදේශීය ලේකම් කාර්යාල මගින් නවීන තාක්ෂණය යොදා පරිගණක මගින් සහතික නිකුත් කිරීමට පියවර ගෙන තිබේ.

| | ආවරණය කරන ලද දිස්ත්‍රික්ක / ප්‍රාදේශීය ලේකම් කාර්යාල | පිටපත් නිකුත් කරන කාර්යාල |
|---|---|---|
| 1. | කොළඹ දිස්ත්‍රික්කයේ සියළුම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ | කොළඹ දිස්ත්‍රික්කයේ සියලුම ප්‍රාදේශීය ලේකම් කාර්යාල |
| 2. | අනුරාධපුර දිස්ත්‍රික්කයේ සියළුම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ | අනුරාධපුර දිස්ත්‍රික්කයේ සියළුම ප්‍රාදේශීය ලේකම් කාර්යාල |
| 3. | පොළොන්නරුව දිස්ත්‍රික්කයේ සියළුම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ | පොළොන්නරුව දිස්ත්‍රික්කයේ සියළුම ප්‍රාදේශීය ලේකම් කාර්යාල |
| 4. | බදුල්ල දිස්ත්‍රික්කයේ සියළුම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ | බදුල්ල දිස්ත්‍රික්කයේ සියළුම ප්‍රාදේශීය ලේකම් කාර්යාල |
| 5. | කෑගල්ල දිස්ත්‍රික්කයේ සියළුම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ | කෑගල්ල දිස්ත්‍රික්කයේ සියළුම ප්‍රාදේශීය ලේකම් කාර්යාල |
| 6. | මොණරාගල දිස්ත්‍රික්කයේ සියළුම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ | මොණරාගල දිස්ත්‍රික්කයේ සියළුම ප්‍රාදේශීය ලේකම් කාර්යාල |
| 7. | යාපනය දිස්ත්‍රික්කයේ සියළුම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ | යාපනය දිස්ත්‍රික්කයේ සියළුම ප්‍රාදේශීය ලේකම් කාර්යාල |
| 8. | පුත්තලම දිස්ත්‍රික්කයේ සියළුම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ | පුත්තලම දිස්ත්‍රික්කයේ සියළුම ප්‍රාදේශීය ලේකම් කාර්යාල |
| 9. | රත්නපුර දිස්ත්‍රික්කයේ සියළුම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ | රත්නපුර දිස්ත්‍රික්කයේ සියළුම ප්‍රාදේශීය ලේකම් කාර්යාල |
| 10. | මාතලේ දිස්ත්‍රික්කයේ සියළුම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ | මාතලේ දිස්ත්‍රික්කයේ සියළුම ප්‍රාදේශීය ලේකම් කාර්යාල |

| | | |
|---|---|---|
| 11. | අම්පාර දිස්ත්‍රික්කයේ සියළුම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ | අම්පාර දිස්ත්‍රික්කයේ සියළුම ප්‍රාදේශීය ලේකම් කාර්යාල |
| 12. | හම්බන්තොට දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය සියළුම ලේකම් කොට්ඨාශ | හම්බන්තොට දිස්ත්‍රික්කයේ සියළුම ප්‍රාදේශීය ලේකම් කාර්යාල |
| 13. | නුවරඑළිය දිස්ත්‍රික්කයේ නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය | නුවරඑළිය දිස්ත්‍රික්කයේ සියළුම ප්‍රාදේශීය ලේකම් කාර්යාල |
| 14. | කිලිනොච්චි දිස්ත්‍රික්කයේ සියළුම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ | කිලිනොච්චි දිස්ත්‍රික්කයේ සියළුම ප්‍රාදේශීය ලේකම් කාර්යාල |
| 15. | මුලතිව් දිස්ත්‍රික්කයේ සියළුම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ | මුලතිව් දිස්ත්‍රික්කයේ සියළුම ප්‍රාදේශීය ලේකම් කාර්යාල |
| 16. | කළුතර දිස්ත්‍රික්කයේ සියළුම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ | කළුතර දිස්ත්‍රික්කයේ සියළුම ප්‍රාදේශීය ලේකම් කාර්යාල |
| 17. | ගම්පහ දිස්ත්‍රික්කයේ සියළුම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ | ගම්පහ දිස්ත්‍රික්කයේ සියළුම ප්‍රාදේශීය ලේකම් කාර්යාල |
| 18. | මහනුවර දිස්ත්‍රික්කයේ සියළුම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ | මහනුවර දිස්ත්‍රික්කයේ සියළුම ප්‍රාදේශීය ලේකම් කාර්යාල |
| 19. | වවුනියාව දිස්ත්‍රික්කයේ සියළුම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය | වවුනියාව දිස්ත්‍රික්කයේ සියළුම ප්‍රාදේශීය ලේකම් කාර්යාල |
| 20. | මන්නාරම දිස්ත්‍රික්කයේ සියළුම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ | මන්නාරම දිස්ත්‍රික්කයේ සියළුම ප්‍රාදේශීය ලේකම් කාර්යාල |
| 21. | ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ සියළුම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ | ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ සියළුම ප්‍රාදේශීය ලේකම් කාර්යාල |
| 22. | මඩකලපුව දිස්ත්‍රික්කයේ සියළුම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ | මඩකලපුව දිස්ත්‍රික්කයේ සියළුම ප්‍රාදේශීය ලේකම් කාර්යාල |
| 23. | මාතර දිස්ත්‍රික්කයේ සියළුම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ | මාතර දිස්ත්‍රික්කයේ අකුරැස්ස, කඹුරුපිටිය,මාතර, වැලිගම, දික්වැල්ල සහ දෙවිනුවර ප්‍රාදේශීය ලේකම් කාර්යාල |
| 24. | ගාල්ල දිස්ත්‍රික්කයේ සියළුම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ | ගාල්ල ,හික්කඩුව , හබරාදූව , බෙන්තොට, බලපිටිය සහ අම්බලන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාල |
| 25 | කුරුණෑගල දිස්ත්‍රික්කයේ කුරුණෑගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය | කුරුණෑගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය |

# VI වන පරිච්ඡේදය

## දෙපාර්තමේන්තුවෙන් සපයනු ලැබූ විශේෂ සේවාවන්

### 01. ජනතා සත්කාරක සේවා

ජනතාවගේ නිශ්චල හ චංචල දේපල සඳහා ඇති අයිතීන් ද ,සිවිල් අයිතීන් ද සුරැකීම සඳහා කාර්යාලයීය මට්ටමින් ඉටු කරනු ලබන ක්‍රියා දාමයට අමතරව ලියාපදිංචි වී නොමැති හා කල් ගිය උපත් ලියාපදිංචි කිරීම සඳහාත්, විවාහ නොවූ පවුල්වල විවාහ ලියාපදිංචි කිරීම සඳහාත් , ජංගම සේවාවන් පවත්වා මහජනතාවට සේවාවන් සපයනු ලැබේ. එකී ජංගම සේවාවන් සඳහා මෙම දෙපාර්තමේන්තුවේ දායකත්වය ලබා දීමට කටයුතු කරනු ලැබේ. 2014 වසර තුළ එවැනි ජංගම සේවා පැවැත්වීම පිළිබඳ විස්තර පහත දැක්වේ.

| අනු අංකය | අනුග්‍රහය දැක්වූ ආයතනය | ජංගම සේවා ගණන |
|---|---|---|
| 01 | රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය | 01 |
| 02 | ජාතික භාෂා සහ සමාජ ඒකාබද්ධතා අමාත්‍යාංශය | 04 |
| 03 | දිස්ත්‍රික් ලේකම් කාර්යාල | 02 |
| 04 | සමාජ සේවා අමාත්‍යාංශය | 01 |
| 05 | ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය | 07 |
| 06 | අධිකරණ අමාත්‍යාංශය | 01 |
| 07 | සමාජ සුභසාධක කටයුතු පිළිබඳ අමාත්‍යාංශය | 01 |
| 08 | මැතිවරණ දෙපාර්තමේන්තුව | 28 |
| 09 | සේවක අර්ථසාධක අරමුදල | 03 |
| 10 | ප්‍රාදේශීය ලේකම් කාර්යාල | 45 |
| 11 | ස්වර්ණවාහිනී ආයතනය | 01 |
| 12 | ග්‍රාම නිලධාරී සමගි සංවිධානය | 01 |
| 13 | බස්නාහිර පළාත් ලේකම් කාර්යාලය | 01 |
| 14 | පැෆරල් සංවිධානය | 12 |
| 15 | CAFÉ සංවිධානය | 03 |

## 02. විශේෂ සේවාවන්

**01.** හිමිකම් සහතික ලබාදීමේ ක්‍රමවේදය කඩිනම් කරලීම උදෙසා සකසන ලද "හිමිකම් ලියාපදිංචි කිරීමේ නව මෘදුකාංගය" රෙජිස්ට්‍රාර් ජනරාල් ඊ.එම්. ගුණසේකර මහතා සහ ජනාධිපති උපදේශක හා කොළඹ විශ්ව විද්‍යාලයේ මෘදුකාංග සංවර්ධන අංශයේ අංශ ප්‍රධානී හර්ෂ විජයවර්ධන මහතා ප්‍රධානත්වයෙන් ද රෙජිස්ට්‍රාර් සේවයේ සියළුම නිලධාරීන්ගේ සහභාගීත්වයෙන් ද 2014.03.04 වන දින රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී දියත් කර ජනතා සේවයට මුදා හරින ලදී.





**02.** විවාහ, උපත් සහ මරණ ලියාපදිංචි කිරීමේදී භාවිතා කිරීම සඳහා හඳුන්වා දුන් ආකෘති පත්‍ර මේ වන විට දිවයින පුරා භාවිතා කිරීමට පියවර ගෙන ඇති අතර, මේ මගින් දත්ත පද්ධතියට තොරතුරු ඇතුලත් කිරීම වඩා පහසු වී ඇත.

**03.** මේ වන විට බොහොමයක් ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාල එක් දිනකදී ඔප්පු ලියාපදිංචි කිරිම සිදු කරයි. තවද රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ වෙබ් අඩවියේ මුල් පිටුවේ සපයා ඇති ඔප්පු ලියාපදිංචි කිරිම යටතේ අදාල තොරතුරු ඇතුලත් කිරීමෙන් අදාල ඔප්පු ලියාපදිංචි වී ඇතිදැයි යන වග දැනගත හැකිය.

## 03.කාර්යාල පහසුකම් වැඩිදියුණු කිරීම

**01.** මොණරාගල ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලය, මොණරාගල දිස්ත්‍රික් ලේකම් කාර්යාල ය පිහිටි ස්ථානයට ගෙන යන ලද අතර 2014.09.01 දින එම නව කාර්යාලය විවෘත කරන ලදි.







**02.** වවුනියාව,පානදුර හා බලපිටිය ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලය නවීකරණය කිරීම සිදු විය.

**පානදුර ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලය**





**වවුනියාව ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලය**








## 04. විදේශ පුහුණු

01. තායිලන්තයේ බැංකොක් නුවර පැවැත්වුණු ආසියා පැසිෆික් කලාපයේ සිවිල් ලියාපදිංචි කිරීම සහ සංඛ්‍යා ලේඛන පිළිබඳ සමුළුව සඳහා වන කලාපීය රැස්වීම සඳහා දෙපාර්තමේන්තු මාණ්ඩලික නිලධාරීන් 2014.08.28-2014.08.29 සහ 2014.11.24-2014.11.28 දින වල සහභාගී වන ලදී.

**02.** ඉන්දියාවේ නවදිල්ලි නුවර පැවැත්වුණු සිවිල් ලියාපදිංචි කිරීම සහ සංඛ්‍යා ලේඛන පිළිබඳ කලාපීය උපදේශන සමුළුව සඳහා දෙපාර්තමේන්තු මාණ්ඩලික නිලධාරීන් 2014.06.16 දින සිට 2014.06.17 දින දක්වා සහභාගී වන ලදී.

# VII වන පරිච්ඡේදය

## ඇගයීම්

❖ කොළඹ සරසවියෙන් නිර්මාණය කරන ලද හිමිකම් ලියාපදිංචි කිරීමේ නව මෘදුකාංගය සඳහා විදුලි සංදේශ හා තොරතුරු තාක්ෂණ අමාත්‍යාංශය වෙතින් "ඉ-ස්වාභිමානි 2014" සම්මානයෙන් පිදුම් ලබන ලදී.





❖ ජාතික ඵලදායිතා ලේකම් කාර්යාලය මඟින් 2012/13 වර්ෂය සඳහා පැවැත්වූ තරගාවලිය තුලින් නුවරඑළිය ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලය පිදුම් ලබන ලදී.



# 2014 වසරේ

# ගිණුම් සාරාංශය

**2014 දෙසැම්බර් 31 දිනට අවසන් වර්ෂය සඳහා වූ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආදායම් ගිණුම් සාරාංශය**

**2014 டிசெம்பர் 31 இல் முடிவடைந்த ஆண்டிற்கான இலங்கை சனநாயக சோசலிசக் குடியரசு அரசாங்கத்தின் அரசிறைக் கணக்குகளின் பொழிப்பு**

# Summary of the Revenue Accounts for the Government of the Democratic Socialist Republic of Sri Lanka for the year ended 31st December 2014

| ආදායම් ගණන්දීමේ නිලධාරි / அரசிறைக் கணக்கீட்டு உத்தியோகத்தர் / Revenue Accounting Officer : | රෙජිස්ට්‍රාර් ජනරාල් /பதிவாளர் நாயகம் / Registrar General | | | වියදම් ශීර්ෂ අංකය / செலவின தலைப்பு இல. / Expenditure Head No. | 254 |
|---|---|---|---|---|---|
| ආදායම් සංකේතය/ அரசிறைக் குறியீடு/ Revenue code | ආදායම් සංකේත විස්තරය / அரசிறைக் குறியீடு விவரணம்/ Description of Revenue Code | 2014 මුලික ආදායම් ඇස්තමේන්තු மூல அரசிறை மதிப்பீடு2014 Original Revenue Estimate 2014 | 2014 සංශෝධිත ආදායම් ඇස්තමේන්තු திருத்திய அரசிறை மதிப்பீடு 2014 Revised Revenue Estimate 2014 | 2014 රැස්කරන ලද මුළු ශු. ආදායම (දළ ආදායම - ආදායම් ආපසු ගෙවීම්) சேகரிக்கப்பட்ட மொத்த தேறிய அரசிறை( அரசிறை மீளளிப்புகளைக் கழித்து ) மொத்த அரசிறை 2014 Total Net Revenue Collected (Gross Revenue less Revenue Refunds) 2014 | 2013 රැස්කරන ලද මුළු ශු. ආදායම (දළ ආදායම - ආදායම් ආපසු ගෙවීම්) சேகரிக்கப்பட்ட மொத்த தேறிய அரசிறை (அரசிறை மீளளிப்புகளைக் கழித்து ) மொத்த அரசிறை 2013 Total Net Revenue Collected (Gross Revenue less Revenue Refunds) 2013 |
| | | රු./ரூபா/ Rs. | රු./ரூபா/ Rs. | රු./ரூபா/ Rs. | රු./ரூபா/ Rs. |
| 10:03:07:02 | ලියාපදිංචි කිරීමේ ගාස්තු / பதிவுக் கட்டணம் / Registration Fee | 1,625,150,000 | 1,200,000,000 | 1,106,416,384 | 1,135,204,321 |
| | **එකතුව/மொத்தம்/ Total** | | | | |

µමම සාරාංශ ප්‍රකාශයෙහි සඳහන් සියළුම සංඛ්‍යා, පවත්වා ගෙන යනු ලබන ගිණුම් පොත්වල සඳහන් සංඛ්‍යා සමග එකඟවන බවත්, ඒවා භාණ්ඩාගාර ගිණුම් පොත් සමග සසඳන ලද බවත් තහවුරු කරමි.
இக்கணக்குகளில் காணப்படும் புள்ளி விவரங்கள் வைத்திருக்கப்படும் கணக்குப் புத்தகங்களிலுகள்ள புள்ளி விவரங்களுடன் ஒத்திருக்கின்றனவெனவும் இப்புள்ளி விவரங்கள் யாவும் திறைசேரிக் கணக்குப் புத்தகங்களுடன் ஒப்பிடப்பட்டன எனவும் உறுதிப்படுத்துகின்றேன்.
Certify that the figures appear in this Summary Statement are in agreement with the figures in the Books of Account maintained and all these figures have been reconciled with the figures in the Treasury Books of Account.

**සටහන: දෙපාර්තමේන්තුවේ ගණනය කිරීම් අනුව 2014 මූලික ඇස්තමේන්තුව රු1,100,000,000 2014 සංශෝධිත ඇස්තමේන්තුව රු1,100,000,000**

දිනය / திகதி / Date 2015.03

ප්‍රධාන ගණකාධිකාරි / මුදල් අංශයේ ප්‍රධානි නම සහ අත්සන
பிரதான கணக்காளரின் நிதிப்பகுதியின் தலைவரின் பெயர் மற்றும் ஒப்பம்
Signature and Name of Chief Accountant / Head of Finance

ආදායම් ගණන්දීමේ නිලධාරි නම, තනතුර සහ අත්සන
வருவாய் கணக்கீட்டு உத்தியோகத்தரின் ஒப்பம் பெயரும் பதவியும்
Signature, Name and Designation of Revenue Accounting Officer

**2014 දෙසැම්බර් 31 දිනට අවසන් වර්ෂය සඳහා වූ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආදායම් ගිණුම් සාරාංශය**

**2014 டிசெம்பர் 31 இல் முடிவடைந்த ஆண்டிற்கான இலங்கை சனநாயக சோசலிசக் குடியரசு அரசாங்கத்தின் அரசிறைக் கணக்குகளின் பொழிப்பு**

# Summary of the Revenue Accounts for the Government of the Democratic Socialist Republic of Sri Lanka for the year ended 31st December 2014

| ආදායම් ගණන්දීමේ නිලධාරී<br>அரசிறைக் கணக்கீட்டு உத்தியோகத்தர்<br>**Revenue Accounting Officer :** | රෙජිස්ට්‍රාර් ජනරාල් /பதிவாளர் நாயகம் / Registrar General | | වියදම් ශීර්ෂ අංකය<br>செலவின தலைப்பு இல.<br>**Expenditure Head No.** | **254** | |
|---|---|---|---|---|---|
| ආදායම් සංකේතය/ அரசிறைக் குறியீடு/Revenue code | ආදායම් සංකේත විස්තරය / அரசிறைக் குறியீடு விவரணம்/ Description of Revenue Code | 2014 මූලික ආදායම් ඇස්තමේන්තු மூல அரசிறை மதிப்பீடு2014 Original Revenue Estimate 2014 | 2014 සංශෝධිත ආදායම් ඇස්තමේන්තු திருத்திய அரசிறை மதிப்பீடு 2014 Revised Revenue Estimate 2014 | 2014 රැස්කරන ලද මුළු ශු. ආදායම (දළ ආදායම - ආදායම් ආපසු ගෙවීම්) சேகரிக்கப்பட்ட மொத்த தேறிய அரசிறை( அரசிறை மீளளிப்புகளைக் கழித்து ) மொத்த அரசிறை 2014 Total Net Revenue Collected (Gross Revenue less Revenue Refunds) 2014 | 2013 රැස්කරන ලද මුළු ශු. ආදායම (දළ ආදායම - ආදායම් ආපසු ගෙවීම්) சேகரிக்கப்பட்ட மொத்த தேறிய அரசிறை( அரசிறை மீளளிப்புகளைக் கழித்து ) மொத்த அரசிறை 2013 Total Net Revenue Collected (Gross Revenue less Revenue Refunds) 2013 |
| | | රු./ரூபா/Rs. | රු./ரூபா/Rs. | රු./ரூபா/Rs. | රු./ ரூபா/Rs. |
| 10:03:08:00 | නොතාරිස්වරුන්ට වාර්ෂික මහාධිකරණ නිකුත් කිරීමේ ගාස්තු/ Issuing of court cetificates | **7,000,000** | **20,000,000** | **17,585,171** | **-** |
| | **/மொத்தம்/ Total** | **7,000,000** | **20,000,000** | **17,585,171** | **-** |

මෙම සාරාංශ ප්‍රකාශයෙහි සඳහන් සියළුම සංඛ්‍යා, පවත්වා ගෙන යනු ලබන ගිණුම් පොත්වල සඳහන් සංඛ්‍යා සමග එකඟවන බවත්, ඒවා භාණ්ඩාගාර ගිණුම් පොත් සමග සසඳන ලද බවත් තහවුරු කරමි.

இக்கணக்குகளில் காணப்படும் புள்ளி விவரங்கள் வைத்திருக்கப்படும் கணக்குப் புத்தகங்களிலுகள்ள புள்ளி விவரங்களுடன் ஒத்திருக்கின்றனவெனவும் இப்புள்ளி விவரங்கள் யாவும் திறைசேரிக் கணக்குப் புத்தகங்களுடன் ஒப்பிடப்பட்டன எனவும் உறுதிப்படுத்துகின்றேன்.

Certify that the figures appear in this Summary Statement are in agreement with the figures in the Books of Account maintained and all these figures have been reconciled with the figures in the Treasury Books of Account.

**සටහන: දෙපාර්තමේන්තුවේ ගණනය කිරීම් අනුව 2014 මූලික ඇස්තමේන්තුව රු6,000,000 2014 සංශෝධිත ඇස්තමේන්තුව රු10,000,000**

| | | | |
|---|---|---|---|
| දිනය<br>திகதி<br>Date | 2015.03 | ප්‍රධාන ගණකාධිකාරි / මුදල් අංශයේ ප්‍රධානි නම සහ අත්සන<br>பிரதான கணக்காளரின் நிதிப்பகுதியின் தலைவரின் பெயர் மற்றும் ஒப்பம்<br>SIgnature and Name of Chief Accountant / Head of Finance | ආදායම් ගණන්දීමේ නිලධාරී නම, තනතුර සහ අත්සන<br>வருவாய் கணக்கீட்டு உத்தியோகத்தரின் ஒப்பம் பெயரும் பதவியும்<br>SIgnature, Name and Designation of Revenue Accounting Officer |

# විසර්ජන ගිණුම 2014

**වියදම් ශීර්ෂ අංකය: 254** **අමාත්‍යාංශයේ/ දෙපාර්තමේන්තුවේ/ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නම : රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව**

| වාර්ෂික ඇස්තමේන්තුවෙහි සඳහන් වැඩසටහන් අංකය | වාර්ෂික ඇස්තමේන්තුවෙහි සඳහන් වැඩසටහනෙහි නම | (1) අයවැය ඇස්තමේන්තු වෙන් කිරිම | පරිපූරක ප්‍රතිපාදන හා පරිපූරක ඇස්තමේන්තු වෙන් කිරීම් | (3) මු.රෙ. 66 සහ 69 අනුව මාරු කිරීම් | (4) මුළු ශුද්ධ වෙන් කිරිම | (5) මුළු වියදම | (6) ශුද්ධ ප්‍රතිඵලය ඉතිරිය/ (අතිරික්තය) (4-5) | පිටු අංකය (අදාල ඩී.ජී.එස්.ඒ. 2 ආකෘතියට අනුව) |
|---|---|---|---|---|---|---|---|---|
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | |
| 01 | <u>පුනාරාවර්තන</u><br>ප්‍රමහෙයුම් ක්‍රියාකාරකම් | 871,400,000 | 169,700,000 | - | 1,041,100,000 | 1,015,454,005 | 25,645,995 | **02** |
| | **උප එකතුව (පුනාරාවර්තන)** | 871,400,000 | 169,700,000 | - | 1,041,100,000 | 1,015,454,005 | 25,645,995 | |
| 01 | <u>මූලධන</u><br>ප්‍රමහෙයුම් ක්‍රියාකාරකම් | 53,100,000 | - | - | 53,100,000 | 47,429,921 | 5,670,079 | **02** |
| | **උප එකතුව (මූලධන)** | 53,100,000 | - | - | 53,100,000 | 47,429,921 | 5,670,079 | |
| 01 | පුනාරාවර්තන එකතුව | 871,400,000 | 169,700,000 | - | 1,041,100,000 | 1,015,454,005 | 25,645,995 | **02** |
| 01 | මූලධන එකතුව | 53,100,000 | - | - | 53,100,000 | 47,429,921 | 5,670,079 | **02** |
| | මුළු එකතුව | **924,500,000** | **169,700,000** | **-** | **1,094,200,000** | **1,062,883,926** | **31,316,074** | |

පිටු අංක...01....... සිට ...25...... දක්වා ඩී.ජී.එස්.ඒ. 2 සිට 11 දක්වාවූ ආකෘතිපත්‍ර වලින් ඉදිරිපත් කෙරෙන විස්තරාත්මක වැඩසටහන් විසර්ජන ගිණුම් ප්‍රකාශයන්ද අංක...26....... සිට ...50....... දක්වාවූ අනෙකුත් අදාල සටහන්ද මෙම විසර්ජන ගිණුමෙහිම අන්තර්ගත කොටසක් ලෙස සැකසේ.

මෙම ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, අනිකුත් සවිස්තරාත්මක ප්‍රකාශන හා අනිකුත් සටහන් නිවැරදි බවත් , භාණ්ඩාගාර ගිණුම් පොත් සමග අදාල ගිණුම් සැසඳීම් කරන ලද බවත් ඒවා නිවැරදි බවට තහවුරු වී ඇති බවත් මෙයින් සහතික කරමි.

ප්‍රධාන ගණකාධිකාරි/ අධ්‍යක්ෂ (මුදල්)/ කොමසාරිස් (මුදල්)
නම:
දිනය :

ගණන්දීමේ නිළධාරි
නම:
තනතුර:
දිනය :

**ප්‍රධාන ගණන්දීමේ නිලධාරී**
**නම:**
**දිනය:**

ඩී.ජී.එස්.ඒ - 2

# වැඩසටහන් අනුව විසර්ජන ගිණුම-2014

**වියදම් ශීර්ෂ අංකය: 254** අමාත්‍යාංශයේ/ දෙපාර්තමේන්තුවේ/ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නම : රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

වැඩ සටහන් අංකය හා නාමය : 01 මෙහෙයුම් ක්‍රියාකාරකම්

## පුනරාවර්තන හා මූලධන වියදම් සාරාංශය

| වියමෙහි ස්වභාවය (ඩී.ජී.එස්.ඒ. ආකෘති යොමුව සමග) | (1) අයවැය ඇස්තමේන්තු වෙන් කිරීම් | (2) පරිපූරක ප්‍රතිපාදන හා පරිපූරක ඇස්තමේන්තු වෙන් කිරීම් | (3) මු.රෙ. 66 සහ 69 අනුව මාරු කිරීම් | (4) මුළු ශුද්ධ වෙන් කිරීම (1-2)+3+4 | (5) මුළු වියදම | (6) ශුද්ධ ප්‍රතිඵලය ඉතිරිය/ (අතිරික්තය) අවුරා තබන ලද ප්‍රතිපාදනය සහිතව (1+3+4)-6 | සිටු අංකය (අදාළ ඩී.ජී.එස්.ඒ. ආකෘතියට අනුව) |
|---|---|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | |
| (අ) පුනරාවර්තන (ඩී.ජී.එස්.ඒ. 3) | 871,400,000 | 169,700,000 | - | 1,041,100,000 | 1,015,454,005 | 25,645,995 | **03** |
| (ආ) මූලධන (ඩී.ජී.එස්.ඒ. 4) | 53,100,000 | - | - | 53,100,000 | 47,429,921 | 5,670,079 | **04 & 05** |
| එකතුව | **924,500,000** | **169,700,000** | **-** | **1,094,200,000** | **1,062,883,926** | **31,316,074** | |

ප්‍රධාන ගණකාධිකාරී/ අධ්‍යක්ෂ (මුදල්)/ කොමසාරිස් (මුදල්)

නම:

දිනය :

ඩී.ජී.එස්.ඒ - 3

# වියාපෘති අනුව පුනරාවර්තන වියදම්

වියදම් ශීර්ෂ අංකය: 254 අමාත්‍යාංශයේ/ දෙපාර්තමේන්තුවේ/ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නම : රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව
වැඩ සටහන් අංකය හා නාමය : 01 මෙහෙයුම් ක්‍රියාකාරකම්

| වියාපෘති අංකය /නම, පෞද්ගලික පඩිනඩි සහ සියළුම වියාපෘති සඳහා අනිකුත් අයකිරීම් | (1) අයවැය ඇස්තමේන්තු වෙන් කිරීම් | (2) පරිපූරක ප්‍රතිපාදන හා පරිපූරක ඇස්තමේන්තු වෙන් කිරීම් (+/-) | (3) මු.රෙ. 66, 69 අනුව මාරුකිරීම් (+/-) | (4) මුළු ශුද්ධ වෙන් කිරීම (1-2+3) | (5) මුළු වියදම | (6) ශුද්ධ ප්‍රතිඵලය ඉතිරිය/ (අතිරික්තය) (4-5) |
|---|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| <u>වියාපෘති අංකය 01 හා නම:සාමාන්‍ය පරිපාලනය සහ ආයතන සේවා</u> | | | | | | |
| පෞද්ගලික පඩිනඩි | 104,250,000 | 1,000,000 | (15,200,000) | 90,050,000 | 89,983,669 | 66,331 |
| අනෙකුත් වියදම් | 46,550,000 | 500,000 | (600,000) | 46,450,000 | 37,688,572 | 8,761,428 |
| උප එකතුව | 150,800,000 | 1,500,000 | (15,800,000) | 136,500,000 | 127,672,241 | 8,827,759 |
| <u>වියාපෘති අංකය 02 හා නම: ලියාපදිංචි කිරීමේ කටයුතු</u> | | | | | | |
| පෞද්ගලික පඩිනඩි | 533,000,000 | 102,000,000 | 14,500,000 | 649,500,000 | 649,080,227 | 419,773 |
| අනෙකුත් වියදම් | 187,600,000 | 66,200,000 | 1,300,000 | 255,100,000 | 238,701,538 | 16,398,462 |
| උප එකතුව | 720,600,000 | 168,200,000 | 15,800,000 | 904,600,000 | 887,781,765 | 16,818,235 |
| මුළු එකතුව | **871,400,000** | **169,700,000** | **-** | **1,041,100,000** | **1,015,454,006** | **25,645,994** |

ප්‍රධාන ගණකාධිකාරී/ අධ්‍යක්ෂ (මුදල්)/ කොමසාරිස් (මුදල්)
නම:
දිනය:

ඩී.ජී.එස්.ඒ - 4

# <u>ව්‍යපෘති අනුව මූලධන වියදම්</u>

වියදම ශීර්ෂ අංකය: **254** අමාත්‍යාංශයේ/ දෙපාර්තමේන්තුවේ/ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නම : රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

වැඩ සටහන් අංකය හා නාමය : **01** මෙහෙයුම් ක්‍රියාකාරකම්

ව්‍යාපෘති අංකය හා නාමය: **01** සාමාන්‍ය පරිපාලනය සහ ආයතන සේවා

| වැය විෂය අංකය | අයිතම අංකය | මූල්‍යකරණය (සංකේත අංකය) | අයිතම් විස්තරය | අයවැය ඇස්තමේන්තු වෙන්කිරීම් | මු.රෙ. 66 සහ 69 අනුව මාරු කිරීම් පරිපූරක ප්‍රතිපාදන සහ පරිපූරක ඇස්තමේන්තු වෙන් කිරීම් | මුළු ශුද්ධ වෙන්කිරීම (1-2) | මුළු වියදම | ශුද්ධ ප්‍රතිඵලය ඉතිරිය/ (අතිරික්තය) අවුරා තබන ලද ප්‍රතිපාදනය සහිතව (1+3)-5 |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | (1) | (2) | (3) | | (5) |
| | | | | රු. | රු. | රු. | රු. | රු. |
| | | | <u>මූලධන වත්කම් පුනරුත්ථාපනය සහ වැඩි දියුණු කිරීම්</u> | | | | | |
| 2001 | | 11 | ගොඩනැගිලි සහ ඉදි කිරීම් | 1,000,000 | - | 1,000,000 | 235,515 | 764,485 |
| 2002 | | 11 | යන්ත්‍ර, යන්ත්‍රෝපාංග සහ උපකරණ | 750,000 | - | 750,000 | 536,805 | 213,195 |
| | | | උප එකතුව | 1,750,000 | - | 1,750,000 | 772,320 | 977,680 |
| | | | <u>මූලධන වත්කම් අත්පත් කර ගැනීම</u> | | | | | |
| 2102 | | 11 | ගෘහ භාණ්ඩ හා කාර්යාලීය උපකරණ | 3,000,000 | - | 3,000,000 | 2,337,740 | 662,260 |
| 2103 | | 11 | යන්ත්‍ර, යන්ත්‍රෝපාංග සහ උපකරණ | 3,000,000 | - | 3,000,000 | 2,963,189 | 36,811 |
| 2104 | | 11 | ගොඩනැගිලි සහ ඉදි කිරීම් | 10,000,000 | (10,000,000) | - | - | - |
| | | | උප එකතුව | 16,000,000 | (10,000,000) | 6,000,000 | 5,300,929 | 699,071 |
| | | | හැකියා වර්ධනය | | | | | |
| 2401 | | 11 | පුහුණු කිරීම් සහ හැකියා වර්ධනය | 350,000 | - | 350,000 | 117,575 | 232,425 |
| | | | උප එකතුව | 350,000 | - | 350,000 | 117,575 | 232,425 |
| | | | මුළු එකතුව | **18,100,000** | **(10,000,000)** | **8,100,000** | **6,190,824** | **1,909,176** |

ප්‍රධාන ගණකාධිකාරී/ අධ්‍යක්ෂ (මුදල්)/ කොමසාරිස් (මුදල්)
නම:
දිනය :

0 ඩී.ජී.එස්.ඒ - 4

# ව්‍යාපෘති අනුව මූලධන වියදම්

වියදම ශීර්ෂ අංකය: 254 අමාත්‍යාංශයේ/ දෙපාර්තමේන්තුවේ/ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නම : රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

වැඩ සටහන් අංකය හා නාමය : 01 මෙහෙයුම් ක්‍රියාකාරකම්

ව්‍යාපෘති අංකය හා නාමය: 02 ලියාපදිංචි කිරීමේ ගාස්තු

| වැය විෂය අංකය | අයිතම අංකය | මූල්‍යකරණය (සංකේත අංකය) | අයිතම විස්තරය | අයවැය ඇස්තමේන්තු වෙන්කිරීම් | මු.රෙ. 66 සහ 69 අනුව මාරු කිරීම් පරිපූරක ප්‍රතිපාදන සහ පරිපූරක ඇස්තමේන්තු වෙන් කිරීම් | මුළු ශුද්ධ වෙන්කිරීම (1-2+3) | මුළු වියදම | ශුද්ධ ප්‍රතිඵලය ඉතිරිය/ (අතිරික්තය) අවුරා තබන ලද ප්‍රතිපාදනය සහිතව (4-5) |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | (1) | (2) | (3) | (4) | (5) |
| | | | | රු. | රු. | රු. | රු. | රු. |
| | | | <u>මූලධන වත්කම් පුනරුත්ථාපනය සහ වැඩි දියුණු කිරීම්</u> | | | | | |
| 2001 | | 11 | ගොඩනැගිලි සහ ඉදි කිරීම් | 10,000,000 | 10,000,000 | 20,000,000 | 18,687,094 | 1,312,906 |
| | | | උප එකතුව | 10,000,000 | 10,000,000 | 20,000,000 | 18,687,094 | 1,312,906 |
| | | | <u>මූලධන වත්කම් අත්පත් කර ගැනීම</u> | | | | | |
| 2102 | | 11 | ගෘහ භාණ්ඩ හා කාර්යාලීය උපකරණ | 10,000,000 | - | 10,000,000 | 9,640,241 | 359,759 |
| 2103 | | 11 | යන්ත්‍ර, යන්ත්‍රෝපාංග සහ උපකරණ | 10,000,000 | - | 10,000,000 | 8,445,407 | 1,554,593 |
| 2104 | | 11 | ගොඩනැගිලි සහ ඉදි කිරීම් | 5,000,000 | - | 5,000,000 | 4,466,356 | 533,644 |
| | | | උප එකතුව | 25,000,000 | | 25,000,000 | 22,552,004 | 2,447,996 |
| | | | <u>හැකියා වර්ධනය</u> | | | | | |
| 2401 | | 11 | පුහුණු කිරීම් සහ හැකියා වර්ධනය | - | - | - | - | - |
| | | | උප එකතුව | - | - | - | - | - |
| | | | මුළු එකතුව | **35,000,000** | **10,000,000** | **45,000,000** | **41,239,097** | **3,760,903** |
| | | | සමස්ත එකතුව | **53,100,000** | **-** | **53,100,000** | **47,429,921** | **5,670,079** |

ප්‍රධාන ගණකාධිකාරී/ අධ්‍යක්ෂ (මුදල්)/ කොමසාරිස් (මුදල්)
නම:
දිනය :

ඩී.ජී.එස්.ඒ - 5

# වියදම් මූලාශ්‍රකරණ සාරාංශය

**(පුනරාවර්තන වියදම් වල ඒකාබද්ධය)**

**වියදම ශීර්ෂ අංකය: 254** **අමාත්‍යාංශයේ/ දෙපාර්තමේන්තුවේ/ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නම : රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව**

**වැඩ සටහන් අංකය හා නාමය : 01 මෙහෙයුම් ක්‍රියාකාරකම්**

| අදාලවන නීතිය | විෂය | ප්‍රභවය | පුනරාවර්ථන | | | | එකතුව | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | වැඩසටහන 01 | | වැඩසටහන 02 | | | | |
| | | | ශුද්ධ ප්‍රතිපාදන | සත්‍ය වියදම | ශුද්ධ ප්‍රතිපාදන | සත්‍ය වියදම | ශුද්ධ ප්‍රතිපාදන | සත්‍ය වියදම | වියදමේ ප්‍රතිශතය % |
| | | | රු. | රු. | රු. | රු. | රු. | රු. | |
| විසර්ජන පනත | 11 | දේශීය අරමුදල් පුනරාවර්තන | 1,041,100,000 | 1,015,454,005 | - | - | 1,041,100,000 | 1,015,454,005 | 97.5 |
| | 12 | විදේශීය ආධාර - ණය | | | | | | | |
| | 13 | විදේශීය ආධාර - ප්‍රදාන | | | | | | | |
| | 14 | ප්‍රතිපූර්ණය කල හැකි විදේශීය ආධාර - ණය | | | | | | | |
| | 15 | ප්‍රතිපූර්ණය කල හැකි විදේශීය ආධාර - ප්‍රදාන | | | | | | | |
| | 16 | ප්‍රතිපාර්ශවීය අරමුදල් | | | | | | | |
| | 17 | විදේශාධාර සම්බන්ධ විදේශීය අරමුදල් | | | | | | | |
| විශේෂ නිතී | 21 | දේශීය අරමුදල් | | | | | | | |
| | | **එකතුව (පුනරාවර්තන )** | **1,041,100,000** | **1,015,454,005** | **-** | **-** | **1,041,100,000** | **1,015,454,005** | 97.5 |

ප්‍රධාන ගණකාධිකාරි/ අධ්‍යක්ෂ (මුදල්)/ කොමසාරිස් (මුදල්)
නම:
දිනය:

ඩී.පී.එස්.ඒ - 5

# වියදම් මූලාකරණ සාරාංශය

(මූලධන වියදම් වල ලේඛනය)

වියදම ශීර්ෂ අංකය: **254** අමාත්‍යාංශයේ/ දෙපාර්තමේන්තුවේ/ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නම : රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

වැඩ සටහන් අංකය හා නාමය : **01** මෙහෙයුම් ක්‍රියාකාරකම්

| අදාලවන නීතිය | විෂය | ප්‍රභවය | මූලධන වැඩසටහන ශුද්ධ ප්‍රතිපාදන | මූලධන වැඩසටහන සත්‍ය වියදම | මූලධන වැඩසටහන 02 ශුද්ධ ප්‍රතිපාදන | මූලධන වැඩසටහන 02 සත්‍ය වියදම | එකතුව ශුද්ධ ප්‍රතිපාදන | එකතුව සත්‍ය වියදම | වියදමේ ප්‍රතිශතය % |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | රු. | රු. | රු. | රු. | රු. | රු. | |
| විසර්ජන පනත | 11 | දේශීය අරමුදල් මූලධන | 53,100,000 | 47,429,921 | - | - | 53,100,000 | 47,429,921 | 89.3 |
| | 12 | විදේශීය ආධාර - ණය | | | | | | | |
| | 13 | විදේශීය ආධාර - ප්‍රදාන | | | | | | | |
| | 14 | ප්‍රතිපූර්ණය කල හැකි විදේශීය ආධාර - ණය | | | | | | | |
| | 15 | ප්‍රතිපූර්ණය කල හැකි විදේශීය ආධාර - ප්‍රදාන | | | | | | | |
| | 16 | ප්‍රතිපාර්ශවීය අරමුදල් | | | | | | | |
| | 17 | විදේශාධාර සම්බන්ධ දේශීය අරමුදල් | | | | | | | |
| විශේෂ නීති | 21 | දේශීය අරමුදල් | | | | | | | |
| | | **එකතුව (මූලධන )** | **53,100,000** | **47,429,921** | **-** | **-** | **53,100,000** | **47,429,921** | 89.3 |
| | | (අදාල නොවන වචන කපා හරින්න) | | | | | | | |

ප්‍රධාන ගණකාධිකාරී/ අධ්‍යක්ෂ (මුදල්)/ කොමසාරිස් (මුදල්)
නම:
දිනය :

ඩී.පී.එස්.ඒ - 5 (i)

# වියදම් මූලාකරණය

**(වැඩසටහනේ ව්‍යාපෘති අනුව)**

වියදම ශීර්ෂ අංකය: **254** අමාත්‍යාංශයේ/ දෙපාර්තමේන්තුවේ/ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නම : රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

වැඩ සටහන් අංකය හා නාමය : **01** මෙහෙයුම් ක්‍රියාකාරකම්

| අදාලවන නීතිය | විෂය | ප්‍රභවය | මූලධන | | | | එකතුව | | වියදමේ ප්‍රතිශතය % |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | ව්‍යාපෘති 01 | | ව්‍යාපෘති 02 | | | | |
| | | | ශුද්ධ ප්‍රතිපාදන | සත්‍ය වියදම | ශුද්ධ ප්‍රතිපාදන | සත්‍ය වියදම | ශුද්ධ ප්‍රතිපාදන | සත්‍ය වියදම | |
| | | | 1 | 2 | 3 | 4 | 5 | 6 | |
| | | | රු. | රු. | රු. | රු. | රු. | රු. | |
| විසර්ජන පනත | 11 | දේශීය අරමුදල් | | | | | | | |
| | | මූලධන | 8,100,000 | 6,190,824 | 45,000,000 | 41,239,097 | 53,100,000 | 47,429,921 | 89.32 |
| | 12 | විදේශීය ආධාර - ණය | | | | | | | |
| | 13 | විදේශීය ආධාර - ප්‍රදාන | | | | | | | |
| | 14 | ප්‍රතිපූර්ණය කල හැකි විදේශීය ආධාර - ණය | | | | | | | |
| | 15 | ප්‍රතිපූර්ණය කල හැකි විදේශීය ආධාර - ප්‍රදාන | | | | | | | |
| | 16 | ප්‍රතිපාර්ශවීය අරමුදල් | | | | | | | |
| | 17 | විදේශාධාර සම්බන්ධ දේශීය අරමුදල් | | | | | | | |
| විශේෂ නිති | 21 | දේශීය අරමුදල් | | | | | | | |
| | | **එකතුව (මූලධන)** | **8,100,000** | **6,190,824** | **45,000,000** | **41,239,097** | **53,100,000** | **47,429,921** | 89.32 |
| | | (අදාල නොවන වචන කපා හරින්න) | | | | | | | |

ප්‍රධාන ගණකාධිකාරි/ අධ්‍යක්ෂ (මුදල්)/ කොමසාරිස් (මුදල්)
නම:
දිනය :

# <u>වියදම් මූලායකරණය</u>

ඩී.ජී.එස්.ඒ - 5 (i)

**(වැඩසටහනේ ව්‍යාපෘති අනුව)**

**වියදම ශීර්ෂ අංකය: 254** **අමාත්‍යාංශයේ/ දෙපාර්තමේන්තුවේ/ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නම : රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව**

**වැඩ සටහන් අංකය හා නාමය : 01 මෙහෙයුම් ක්‍රියාකාරකම්**

| අදාලවන නීතිය | විෂය | ප්‍රභවය | පුනරාවර්ථන | | | | එකතුව | | වියදමේ ප්‍රතිශතය % |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | ව්‍යාපෘති 01 | | ව්‍යාපෘති 02 | | | | |
| | | | ශුද්ධ ප්‍රතිපාදන | සත්‍ය වියදම | ශුද්ධ ප්‍රතිපාදන | සත්‍ය වියදම | ශුද්ධ ප්‍රතිපාදන | සත්‍ය වියදම | |
| | | | 1 | 2 | 3 | 4 | 5 | 6 | |
| | | | රු. | රු. | රු. | රු. | රු. | රු. | |
| විසර්ජන පනත | 11 | දේශීය අරමුදල් | | | | | | | |
| | | පුනරාවර්ථන | 136,500,000 | 127,672,241 | 904,600,000 | 887,781,765 | 1,041,100,000 | 1,015,454,006 | 97.5 |
| | 12 | විදේශීය ආධාර - ණය | | | | | | | |
| | 13 | විදේශීය ආධාර - ප්‍රදාන | | | | | | | |
| | 14 | ප්‍රතිපූර්ණය කල හැකි විදේශීය ආධාර - ණය | | | | | | | |
| | 15 | ප්‍රතිපූර්ණය කල හැකි විදේශීය ආධාර - ප්‍රදාන | | | | | | | |
| | 16 | ප්‍රතිපාර්ශවීය අරමුදල් | | | | | | | |
| | 17 | විදේශාධාර සම්බන්ධ දේශීයඅරමුදල් | | | | | | | |
| විශේෂ නිති | 21 | දේශීය අරමුදල් | | | | | | | |
| | | **එකතුව (පුනරාවර්ථන)** (අදාල නොවන වචන කපා හරින්න) | **136,500,000** | **127,672,241** | **904,600,000** | **887,781,765** | **1,041,100,000** | **1,015,454,006** | 97.5 |

ප්‍රධාන ගණකාධිකාරි/ අධ්‍යක්ෂ (මුදල්)/ කොමසාරිස් (මුදල්)
නම:
දිනය :